# රත්නාකර ශිෂ්‍යාධාර අරමුදල

01. **අරමුදල් නාමය** - රත්නාකර ශිෂ්‍යාධාර අරමුදල

02. **දාතෘ** - බී. විජයවර්ධන මහත්මිය

03. **නිමිත්ත** - රණාල, "ලුම්බිණි"හි පදිංචි බී. විජයවර්ධන මහත්මියගේ දයාබර දෙමාපියන් වූ වැල්ලම්පිටියේ විසූ දිවංගත ජී. පී. ඩී. ගේබ්‍රියල් යුවලටත්, ජී. පී. ඩී. රෝලන්ඩ් කුමාරදාස සොහොයුරාණන්ටත්, චිත්‍රාංගනී කුමාරරත්න සොහොයුරියටත් පින් පිණිස කැලණිය විශ්වවිද්‍යාලයයේ ඉගෙනුම ලබන ආර්ථික දුෂ්කරතා සහිත විද්‍යාර්ථීන්ට ආධාර කරනු වස් උක්ත ශිෂ්‍යාධාර අරමුදල පිහිටුවනු ලැබේ.

04. **අරමුදලේ භාරකාර මණ්ඩලය** - කැලණිය විශ්වවිද්‍යාලයේ, උපකුලපති, මානවශාස්ත්‍ර පීඨාධිපති, වාග්විද්‍යා අංශප්‍රධාන, වාග්විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු, ලේඛකාධිකාරී හා අරමුදලේ දාතෘ වන බී. විජයවර්ධන මහත්මිය හෝ ඇය විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් අරමුදලේ භාරකාර මණ්ඩලයේ සාමාජිකයෝ වෙති. අනුප්‍රාප්තිකයකු නොමැති විටෙක, බී. විජයවර්ධන මහත්මියගේ අභිමතය පරිදි ඒ වෙනුවෙන් වාග්විද්‍යා අංශය තම සාමාජිකයකු උක්ත තනතුර සඳහා නම් කළ යුතු වේ.

මේ පුද්ගලයන්ගෙන් සමන්විත මණ්ඩලය "**කැලණිය විශ්වවිද්‍යාලයයේ රත්නාකර ශිෂ්‍යාධාර අරමුදලේ භාරකාර මණ්ඩලය**" ලෙස නම් කෙරේ. අරමුදලේ පාලනය, එහි පැවැත්ම තහවුරු කිරීම, එය සංවර්ධනය කිරීම හා ශිෂ්‍යාධාර ප්‍රදානය මේ මණ්ඩලයේ කාර්යය වෙයි. උක්ත අරමුදල සම්බන්ධ කාර්යයන්හි දී භාරකාර මණ්ඩලයේ තිරණය අවසාන තිරණය වෙයි.

05. **ශිෂ්‍යාධාරයේ ස්වභාවය** - මෙම ශිෂ්‍යාධාරය වාර්ෂික ව අධ්‍යයන වර්ෂයක මාස දහයක කාල සීමාවක් සඳහා පිරිනැමේ. ඉහත නම් සඳහන් බී. විජයවර්ධන මහත්මිය විසින් කැලණිය විශ්වවිද්‍යාලයයේ වාග්විද්‍යා අංශයට පරිත්‍යාග කරනු ලබන රුපියල් ලක්ෂයක මුදල කැලණිය විශ්වවිද්‍යාලය මැනවැයි තිරණය කරන බැංකුවක ස්ථිර ගිණුමක තැන්පත් කරනු ලැබේ. එහි වාර්ෂික පොලියෙන් අවම වශයෙන් රුපියල් තුන්සිය පනහක් (රුපියල් 350ක්) එක් විද්‍යාර්ථියකුට ශිෂ්‍යාධාර වශයෙන් ගෙවනු ලැබේ. පිරිනැමෙන ශිෂ්‍යාධාර සංඛ්‍යාව වාර්ෂික පොලියෙන් ලැබෙන මුදලට සමානුපාතික ව එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විය හැකිය.

06. **ශිෂ්‍යාධාරලාභියා තීරණය කිරීමේ නිර්ණායක** -

6.1 ශිෂ්‍යාධාරලාභියා තීරණය කිරීමේ දී විද්‍යාර්ථියකුගේ මුදල් අවශ්‍යතා මෙන් ම කුශලතා ද සැලකිල්ලට ගනු ලැබේ

6.2 එමෙන් ම ඔහු/ඇය කැලණිය විශ්වවිද්‍යාලයයේ (සාමාන්‍ය/ගෞරව) ශාස්ත්‍රවේදී උපාධිය සඳහා වාග්විද්‍යා අධ්‍යයනාංශය යටතේ වාග්විද්‍යාව ප්‍රධාන විෂයයක් (co-subject/main subject) ලෙස හදාරන්නකු/හදාරන්නියක විය යුතු ය.

6.3 ශිෂ්‍යාධාරලාභියාගේ ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂභාවය, ගිහි පැවිදිභාවය කිසි දු ලෙසකින් ඔහුට/ඇයට ශිෂ්‍යාධාරය ලබාගැනීමට බාධාවක් නොවිය යුතු ය.

6.4 උක්ත විද්‍යාර්ථියා වෙනත් ශිෂ්‍යාධාර/ශිෂ්‍යත්ව හෝ ප්‍රදාන ලබා සිටීම මෙම ශිෂ්‍යත්වය ලැබීම සඳහා නුසුදුසුකමක් නොවේ.

6.5 මුදල් අවශ්‍යතා හෙවත් ආර්ථික දුෂ්කරතා ගණනය කිරීමේදී පහත සඳහන් සාධක කෙරෙහි අවධානය යොමු කෙරේ.

1. පවුලේ වර්ෂික ආදායම රුපියල් 90,000ට නොවැඩි විය යුතු ය.
2. අධ්‍යාපනය ලබන්නන්ගේ සංඛ්‍යාව: පාසැල් අධ්‍යාපනය ලබන තිදෙනකු සඳහා එක් අයකු වෙනුවෙන් රුපියල් 12,000ක් ද, විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන්නකු වෙනුවෙන් රුපියල් 18,000ක් ද වශයෙන් ඉහත 1හි සඳහන් මුදලට එකතු කළ හැකි ය.
3. යැපෙන්නන්ගේ සංඛ්‍යාව:
4. විද්‍යාර්ථියා ලබන වෙතත් ශිෂ්‍යත්ව/ශිෂ්‍යාධාර හෝ ප්‍රදාන:
5. අදාළ වෙනත් විශේෂ සමාජාර්ථික හේතු:

ඉහත සඳහන් 1, 2, 3, 5 කරුණු තමන් අයත් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් විසින් සනාථ කරනු ලැබිය යුතු වේ. උත්ත සාධක අනුව ගණනය කරනු ලබන ඒක පුද්ගල වියදම අනුව ශිෂ්‍යාධාරය ඉල්ලුම් කරනු ලබන්නන් අතුරින් වඩාත් ආර්ථික අපහසුකම් සහිත විද්‍යාර්ථියා හෝ විද්‍යාර්ථිහු ශිෂ්‍යාධාරය ලැබීමට සුදුසුකම් ලබති.

**07. කුශලතා** - කැලණිය විශ්වවිද්‍යාලයයේ ඉගෙනුම ලබන දෙවන, තුන්වන, සතරවත වර්ෂවලට අයත් විද්‍යාර්ථිහු උක්ත ශිෂ්‍යාධාරය ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වෙති. ඔවුහු ශිෂ්‍යාධාරය ඉල්ලුම් කරන වර්ෂයට පූර්ව වර්ෂයේ අවම වශයෙන් අභ්‍යාස හා දේශන පන්ති අතරින් 80%කට වඩා සහභාගී වී තිබිය යුතු අතර එම වර්ෂයට අදාළ පරීක්ෂණවලින් ඉහළ ලකුණු ලබා තිබිය යුතු ය. ඔහු හෝ ඇය උගන්නා වෙනත් විෂයයන් සඳහා දක්වන කුශලතා ද මෙහි දී සැලකිල්ලට ගනු ලැබේ.

**08. ශිෂ්‍යාධාරලාභියා තේරීම** - ඉහත 6හි දක්වන ලද නිර්ණායක අනුව ශිෂ්‍යාධාරලාභියා හෝ ශිෂ්‍යාධාරලාභීන් තේරීම කැලණිය විශ්වවිද්‍යාලයයේ වාග්විද්‍යා අංශප්‍රධාන ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය විසින් සිදුකරනු ලැබේ.

නිර්දේශිත නම් දැනගැනීම සඳහා අරමුදලේ භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම මැනවි.

**09. ශිෂ්‍යාධාරය අහෝසි කිරීම** - ශිෂ්‍යාධාරලාභියා විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු අසත්‍ය බව සනාථ වූ ඕනෑම විටෙක හා සාධාරණ හේතුවකින් තොර ව විද්‍යාර්ථියා අධ්‍යයන කාර්යයන්හි සප්‍රමාණික සහභාගිත්වයක් නොදක්වන්නේ නම් වාග්විද්‍යා අංශයේ නිර්දේශය අනුව උක්ත ශිෂ්‍යාධාරය අහෝසි කිරීමේ බලය "රත්නාකර අරමුදලේ" භාරකාර මණ්ඩලය සතු වේ.

**10. ශිෂ්‍යාධාරය සඳහා ඉල්ලුම්පත් කැඳවීම** - කිසියම් අධ්‍යයන වර්ෂයක් ආරම්භයේ ශිෂ්‍යාධාරය පිළිබඳ ව විශ්වවිද්‍යාලය විසින් විද්‍යාර්ථීන්ට දැනුම්දෙනු ලැබිය යුතු වේ. විද්‍යාර්ථීන් නිසි ලෙස පුරවන ලද

ඉල්ලුම්පත් කරුණු සනාථ කිරීමේ සහතික/ලිපි සමග ***"සහකාර ලේඛකාධිකාරී, ශිෂ්‍ය සේවා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය"*** වෙත ඉදිරිපත් කළ යුතු ය.

11. **ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමේ දිනය හා ස්ථානය** - කිසියම් අධ්‍යයන වර්ෂයක් ආරම්භ වී තෙමසක් ඉකුත් වීමට පළමු ව, එළඹෙන මානවශාස්ත්‍ර පීඨ මණ්ඩල රැස්වීමක දී තෝරාගත් විද්‍යාර්ථීන්ට ශිෂ්‍යාධාරය ප්‍රථම වාරිකය හා/හෝ ශිෂ්‍යාධාරලාභිත්වය දැනුම්දීමේ ලිපිය පිරිනැමීම උචිත ය.

12. **ශිෂ්‍යාධාර ප්‍රදානය දැනුම් දීම** - විශ්වවිද්‍යාලය විසින් ශිෂ්‍යාධාර ප්‍රදානය කරනු ලබන දිනය අරමුදලේ භාරකාර මණ්ඩලයට දැනුම්දිය යුතු වේ. උක්ත අරමුදලේ දායකත්වය දරන බී. විජයවර්ධන මහත්මිය එකී භාරකාර මණ්ඩලයේ සාමාජිකයකු නොවන විටෙක ඇයට ද ශිෂ්‍යාධාර ප්‍රදානය පිළිබඳ දැනුම් දිය යුතු ය. මේ සැම දෙනාට ම ශිෂ්‍යාධාර ප්‍රදානය අවස්ථාවට සහභාගිවන ලෙස ආරාධනා කිරීම මැනවි.

13. **අරමුදල සංවර්ධනය හා ශිෂ්‍යාධාරයේ ස්වභාවයේ සංශෝධනය කිරීම** - භාරකාර මණ්ඩලයේ එකඟතාව අනුව කරනු ලබන ඉල්ලීමක් අනුව උක්ත අරමුදල වෙත කරනු ලබන පරිත්‍යාග මඟින් අරමුදල සංවර්ධනය කළ හැකි වන්නේ ය. එසේ ම, කාලීන අවශ්‍යතා අනුව මෙන් ම භාරකාර මණ්ඩලයේ එකඟතාව අනුව ද රත්නාකර අරමුදල හා ශිෂ්‍යාධාරය පිළිබඳ නිර්ණායක, ශිෂ්‍යාධාරයේ ස්වභාවය සංශෝධනය කළ හැකි වෙයි. කෙසේ වුව ද, අරමුදලේ ආරම්භක දාතෘගේ හෝ ඇය විසින් බලය පවරනු ලබන නියෝජිතයකුගෙන් ලබාගන්නා ලද පූර්ව, පූර්ණ ලිඛිත අවසරයකින් තොර ව මේ අරමුදල අන්සතු කිරීම හෝ අහෝසි කිරීම නොකළ හැක්කේ ය.

14. **ශිෂ්‍යාධාරය ප්‍රදානය කරනු ලබන ප්‍රථම අවස්ථාව** - කැලණිය විශ්වවිද්‍යාලයට 1998/99 අධ්‍යයන වර්ෂයට ඇතුළත් වන ඉහත 6හි සඳහන් අවශ්‍යතා සපුරන හා තේරීම් මණ්ඩලය විසින් මැනැවැයි තිරණය කරනු ලබන විද්‍යාර්ථියාට හෝ විද්‍යාර්ථීන්ට මුල් වරට මේ ප්‍රදානය කළ යුතු ය.